# 'භවගාමිත්වය' සම්බන්ධ ආදි බෞද්ධ හා යෝගාචාර විඥ්ඥාණවාදී මතවාද පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*පූජ්‍ය කරපික්කඩ සෝබිත* [1]

ආදි බුදුසමයට අනුව ජීවිතයක ආරම්භය යනු උපතක් නොවේ. පුද්ගලයා අනාදිමත් කාලයක පටන් සසර තුළ නොයෙකුත් දුක් විඳිමින් පැමිණෙන බවත්, දුක කෙළවර කරන තුරු සසර පුරා ගමන් කරන බවත් බෞද්ධ ඉගැන්වීමයි. මෙමගින් පැහැදිලි වන කරුණ නම්, ආදි බුදුසමය **'පුද්ගල භවගාමිත්වය'** පිළිගන්නා බවයි. එසේ නම්, මෙම භවයෙහි වූ පුද්ගලයා මතුභවය කරා ගමන් කරන්නේ කෙසේද, යන්න සම්බන්ධයෙන් බෞද්ධ ආකල්පය විමර්ශනය කළ යුතු වේ. මේ පිළිබඳ ඍජු දේශනාවක් ආදි බුදුසමයෙහි දක්නට නොලැබෙන බැවින්, ඡායාමාත්‍ර වූ දේශනාවන් මත යම් අදහසක් ඉස්මතු කරගත යුතු වේ. බුදුසමයට අනුව පුද්ගලයාගේ මෙම භවයෙහි වූ අවසාන චිත්තය චුති චිත්තයයි. ඉන් පසු ඔහුගේ මරණය සිදු වන අතර, දීඝ නිකායේ මහාසතිපට්ඨාන සූත්‍රයේදී මරණය ලෙස දක්වන්නේ සත්ත්වයාගේ බිඳීමත්, චුත වීමත්ය. මෙම විග්‍රහයේ එන පද පිළිබඳ විශ්ලේෂණය කර බැලීමේදී, ඒ සියල්ල අවධි විභක්ත්‍යන්ත පද ලෙස දක්වා තිබීමෙන් සත්ත්වයාගේ විනාශයක් අවධාරණය නොවේ. එසේම මතු භවයක් ලෙස ආදි බුදුසමයෙහි දැක්වෙන්නේ ප්‍රතිසන්ධි චිත්තයාගේ නිර්මාණයයි. එය **'උපත'** නම් වන අතර, මේ පිළිබඳ දක්වන දීඝ නිකාය මහාසතිපට්ඨාන සූත්‍රය, එය නැවත ආරම්භයක් ලෙස නොව, නැවත පහළ වීමක් ලෙස දක්වා ඇත. එසේම ප්‍රතිසන්ධි චිත්තයාගේ නිර්මාණයද චුති චිත්තයේ නිරුද්ධ වීමත් සමග ඒ හා බැඳී හටගනු පෙනෙයි. ඒ අනුව කුඩැල්ලෙකුගේ ගමන් විලාසය මෙන් චුති චිත්තය මතුභවය හා සම්බන්ධ වීමෙන් නිරුද්ධ වන බව සිතිය හැකිය. මෙය ආත්මවාදී දර්ශනයක් ලෙස ඇතමුන් විග්‍රහ කළද, මෙහි පවත්නා වූ ප්‍රතීත්‍යසමුප්පාද න්‍යායානුකූල ක්‍රියාකාරිත්වයෙහිදී එය ආත්මවාදයෙන් බැහැර වී ඇත. මීට අමතරව පෙර භවයත් මතු භවයත් අතර අන්තරා භව අවස්ථාවක් පිළිබඳ ඇතමුන් අදහස් දක්වන නමුදු, ආදි බුදුසමය අනුව එය පිළිගත නොහැකිය. සූත්‍ර දේශනාවල දක්නට ඇති ඡායා මාත්‍ර වූ එවැනි දේශනා ඔවුන් වරදවා වටහාගෙන ඇති බවක් පෙනේ. ථෙරවාදී සම්ප්‍රදායේද ඇතැම් විවරණයන්හි අන්තරාභව අවස්ථාව පිළිගෙන ඇති බව දැකිය හැකි නමුදු, සමස්තයක් ලෙස ථෙරවාදය එම ඉගැන්වීම් බැහැර කරන්නා වූ සම්ප්‍රදායකි. මේ අනුව පුද්ගලයා විසින් සිදු කරනු ලබන පුඤ්ඤ-පාප, කුසල-

අකුසල විඤ්ඤාණය පදනම්ව භවගාමිත්වය තුළ ක්‍රියාත්මක වේ. මේ පිළිබඳ යෝගාචාර විඤ්ඤාණවාදී ආකල්පය විමසීමේදී, ඔවුහු දක්වන්නා වූ ආලය විඤ්ඤාණය සාංසාරික වූ විඤ්ඤාණ ධාරාවකි. එහි නැවැත්ම අර්හත්වයයි. ඒ තාක් දක්වා ආලය විඤ්ඤාණය නොකැඩී ගමන් කරනු ලබන අතර, පුද්ගලයා විෂයෙහි වූ සියලු කර්ම වාසනා ශක්තීන් මෙහි අන්තර්ගත වේ. ඒවා ආලය විඤ්ඤාණයේ මූල බීජ ලෙස තැන්පත් වී සංසාරය තුළ ක්‍රියාත්මක වේ.

**ප්‍රමුඛ පද:** භවගාමිත්වය, චිත්තය, විඤ්ඤාණය, අන්තරාභවය, බීජ

[1] *භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. karapikkadasobitha@gmail.com*